සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 07 - 2024

## නර්තනය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. විකල්ප වාද්‍ය උපකරණයක් නොවන්නේ,
    1) ටින් බෙරය 2) වල් වළල්ල 3) රබාන 4) දඬුබෙරය
02. ගොඩ සරඹ අවසානයේ දී නටනු ලබන්නේ,
    1) ඉරට්ටිය 2) හමාර පදය 4) කලාසම 4) කස්තිරම
03. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන්නේ,
    1) පහතරට බෙරය 2) දවුල 3) තම්මැට්ටම 4) ගැටබෙරය
04. "එනවා ඇඳුරෝ තරඟෙට කීම කියාගෙන" යනු,
    1) කුළු කවියකි 2) ලී කෙළි කවියකි 3) තාලම් කවියකි 4) කළගෙඩි කවියකි
05. සිදුහත් කුමාරයාගේ අභිනිෂ්ක්‍රමණය පිළිබඳ කියවෙන වන්නමකි,
    1) හනුමා 2) මයුරා 3) සිංහරාජ 4) තුරඟා

- අංක 06 - 10 දක්වා දී ඇති වගන්තිවල හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(තාලම්, යතුර, තම්මැට්ටම, අල්කුරානය, ගොප් කොළ)

06. කමත් භාෂාවේදී කුල්ල ............................................... යනුවෙන් හැඳින්වේ.
07. හේවිසි වාදනයේදී දවුල සමඟ ............................................ වාදනය කරයි.
08. ඉස්ලාම් ආගමිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය ............................................ නමින් හැඳින්වේ.
09. පෙරහැරක කස හඬ නිර්මාණය කර ගැනීම සඳහා ....................................... භාවිතා කළ හැකිය.
10. නර්තන, ගායන, වාදන යන ත්‍රිත්ව ක්‍රියාවලියම ............................................ නර්තනයේ අන්තර්ගත වේ.

- අංක 11 - 15 දක්වා ප්‍රශ්නවල, **A** කොටසට වඩාත් ගැළපෙන පිළිතුර **B** කොටසින් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 11. මඩු බැසීමේ මංගල්‍යය | i. උඩරට |
| 12. විතතානත | ii. රාමසාන් උත්සවය |
| 13. රත්නවල්ලි | iii. පහතරට |
| 14. නෝම්බි ඇල්ලීම | iv. දවුල |
| 15. වෙස් නර්තනය | v. කුළු නැටුම් |

- අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට අදාළව දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, වරහන් තුළ යොදන්න.

16. බහු කාර්ය උපකරණයක් ලෙස කුල්ල හැඳින්වේ. ( )
17. පෙරහැර, වටිනා දෘශ්‍යමාන සංස්කෘතිකාංගයක් නොවේ. ( )
18 තාලම් නැටුම, ස්ත්‍රීන් හා පුරුෂයන් දෙ පිරිසම විසින් නර්තනය කරන ගැමි නැටුමකි. ( )
19. උඩරට වන්නම්, විනෝදාස්වාදය අරමුණු කොට නිර්මාණය වී ඇත. ( )
20. 'අල්ලාහ් දෙවියන්' තෛපොංගල් උත්සවයේ දී සුවිශේෂව පුද ලබයි. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් (2) ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. සම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය උපකරණ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. විකල්ප වාද්‍ය උපකරණ 02 ක් නම් කරන්න. (ල. 02)
ii. සාම්ප්‍රදායික වාද්‍ය උපකරණ 02 ක් නම් කරන්න. (ල. 02)
iii. විකල්ප වාද්‍ය උපකරණයක් නිර්මාණය කරගන්නා ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න. (ල. 02)
iv. විකල්ප වාද්‍ය උපකරණයක් ඇඳ දක්වන්න. (ල. 02)
v. පෙරහැරක තේමාව යටතේ වාදනය සඳහා යොදාගත හැකි විකල්ප වාද්‍ය උපකරණ 02 ක් නම් කරන්න. (ල. 02)

02. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහිම ශිල්පීය ප්‍රාගුණ්‍යය එළි දක්වන අවස්ථා දක්නට ලැබේ.

i. දේශීය නර්තන සම්ප්‍රදායන් දෙකක දක්නට ලැබෙන කළඑළි බැසීමේ අවස්ථා නම් කරන්න. (ල. 02)
ii. කළඑළි මංගල්‍යයක දක්නට ලැබෙන චාරිත්‍ර විධි දෙකක් ලියන්න. (ල. 02)
iii. එක් සම්ප්‍රදායකට අදාළ, කළඑළි බැසීමේ අවස්ථාවක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 06)

03. විවිධ වූ ජන වර්ග ඇසුරු කර ගනිමින් ආගමික හා සංස්කෘතික උත්සව රැසක් බිහි වී ඇත.

i. මුස්ලිම් ජනතාව විසින් මහත් ගෞරවයෙන් සමරනු ලබන සංස්කෘතික උත්සවය නම් කරන්න. (ල. 02)
ii. එම උත්සවය පැවැත්වීමේ ප්‍රධාන අරමුණ ලියන්න. (ල. 02)
iii. එම උත්සවයේ දක්නට ලැබෙන චාරිත්‍ර 03 ක් සඳහන් කරන්න. (ල. 06)

04. නර්තන, ගායන හා වාදන ක්‍රියාකාම් ලිඛිතව සටහන් කිරීම ප්‍රස්තාරකරණයයි.

i. දෙතිතේ තාල රූප නම් කරන්න. (ල. 03)
ii. 'දොං ජිංත ගත දොංත' යන බෙර පදය නියමිත තිතට ප්‍රස්තාර කරන්න. (ල. 04)
iii. මැදුම් තනි තිතට (3+3) අයත් ඔබ දන්නා කවියක් ලියා දක්වන්න. (ල. 03)

05. පහත සඳහන් මාතෘකා අතරින් 02 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. ජන ගායනා
ii. දවුල
iii. පා සරඹ
iv. පෙරහැර
v. නම්‍යතා අභ්‍යාස (ල. 5 x 2 =10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 07 - 2024

## නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

නම / විභාග අංකයඃ

01. i. කැමති ගායනය (ල. 05)
    ii. ගුරුවරයා විසින් නම් කරන ගායනය (ල. 05)
    (නැලවිලි, ලී කෙළි, කළ ගෙඩි, තලමල වරුණ, කුළු, තාලම්)

02. i. 3 -5 දක්වා ගොඩ සරඹයක් (ගුරුවරයාගේ අභිමතය පරිදි) (ල. 05)
    ii. සරඹයට අදාල කස්තිරම (ල. 05)

03. තුරඟා වන්නමට අදාල අලංකාර මාත්‍රයක් (ල. 10)

04. කුළු හෝ තාලම් ගැමි නැටුම් දෙකෙන් එකක් (ල. 10)

05. කැමති මිනිස් හෝ සත්ව චරිත නිර්මාණයක් (ල. 10)

(මුළු ලකුණු 10 x 5 = 50)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 07 - 2024

## නර්තනය - පිළිතුරු පත්‍රය

නම / විභාග අංකයඃ

### I කොටස

01. රබාන
02. කස්තිරම
03. දවුල
04. තාලම් කවියකි
05. තුරඟා
06. යතුර
07. තම්මැට්ටම
08. අල්කුරානය
09. ගොප්කොළ
10. තාලම්
11. පහතරට
12. දවුල
13. කුලු නැටුම්
14. රාමසාන් උත්සවය
15. උඩරට
16. ✓
17. ✗
18. ✓
19. ✓
20. ✗

(ල 1 x 20 = 20)

### II කොටස

01. i) ටින් බෙරය, දඬු බෙරය, එක්ස්රේ රබාන, ගොප් කොළ තලාව.... ආදී (ල. 02)

ii) ගැටබෙරය, දවුල, පහතරට බෙරය, රබාන, තාලම්පට.... ආදී (ල. 02)

iii) කුමන හෝ විකල්ප වාද්‍ය උපකරණයක් සකස් කරගන්නා ආකාරය පියවර ලෙස ලියා ඇත්නම් (ල. 02)

iv) විකල්ප වාද්‍ය උපරකරණයක රූප සටහන ඇඳ ඇත්නම් (ල. 02)

v) දඬු බෙරය, ටිං බෙර, ගොප් කොළ.... ආදී (ල. 02)

02. i) උඩරට : වෙස් මංගල්‍යය (ශීර්ෂාභරණ මංගල්‍ය)
පහතරට : මඩු බැසීමේ මංගල්‍යය
සබරගමු : ගුරු වරම් දීමේ මංගල්‍යය (ල. 04)

ii) බෝධි පූජා පැවැත්වීම, නැකැත් දින හතම ආසන්නව පේ වීම, විහාරස්ථානයේ ආගමික කටයුතු කිරීම, තෙමසක් උදේ සවස නා පිරිසිදු වීම ආදී ලෙස.

iii) එක් සම්ප්‍රදායක් ඇසුරින් විස්තර කර ඇත්නම්... (ල. 06)

03. i) රාමසාන් උත්සවය

ii) ශුද්ධ වූ ග්‍රන්ථය වන අල්කුරාණය ලොව පහල වූ කාලය සිහිපත් රීරිම සඳහා
පැවැත්වීමට හේතුව : ඉස්ලාම් ආගමිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය වන 'අල් කුරාණය' ලොව පහළ වූ කාලය සිහිපත් කිරීම. (ල. 04)

iii) මාසයක් පුරාවට නෝම්බි ඇල්ලීම හෙවත් උපවාස සීලය ආරක්ෂා කිරීම
අල්කුරාණයට අනුව එකම අල්ලා දෙවියන් පිළිගැනීම, දිනකට 5 වතාවක් එකම දෙවියන් නැමදීම.
ආහාර ධන ධාන්‍ය වස්තු ඇඳුම් පැලඳුම් බෙදා ගැනීම.... ආදී ලෙස ලියා ඇත්නම් (ල. 06)

02. i) සුළු මැදුම් දෙතිත (2+3)
සුළු මහ දෙතිත (2+4)
මැදුම් මහ දෙතිත (3+4) (ල. 03)

ii)

| 1̂ | 2 | 1́ | 2 | 3 | 1̂ | 2 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| දොං | - | ජිං | - | ත | ග | ත | දොං | - | ත |

(ල. 04)

iii) මැදුම් තනි තිතට අයත් කළ ගෙඩි, ලී කෙළි හෝ වෙනත් කවියක් ලියා ඇත්නම්... (ල. 03)

05. මාතෘකාවට අදාළව වැදගත් කරුණු සඳහා ලකුණු ලබා දෙන්න. (ල 5 x 2 = 10)